# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## රුහුණු ගුරු ගෙදර
## 10 ශ්‍රේණිය-ගණිතය- ප්‍රස්තාර
## $y = ax^2$ ආකාරයේ ශ්‍රිත වල ප්‍රස්තාර

M 71

$y = ax^2$ ආකාරයේ ප්‍රස්තාර වල $a > 0$ වන අවස්ථාව

උදාහරණ

$y = x^2$ ශ්‍රිතයෙහි අගය වගුව පහත පරිදි සකස් කළ හැකිය

| $\chi$ | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| $\chi^2$ | 9 | 4 | 1 | 0 | 1 | 4 | 9 |
| y | 9 | 4 | 1 | 0 | 1 | 4 | 9 |
| ඛණ්ඩාංක | (-3,9) | (-2,4) | (-1,1) | (0,0) | (1,2) | (2,4) | (3,9) |




ප්‍රස්තාරයේ ලක්ෂණ

- මෙම ප්‍රස්තාර අවම ලක්ෂ්‍යයක් සහිත පරාවලයක් වේ.
- ප්‍රස්තාරයේ අවම අගය (y අගය) කීයද?.....

ප්‍රස්තාරයේ අවම ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක මොනවාද? ( 0 , 0 )

- ප්‍රස්තාරයේ සමමිති අක්ෂයේ සමීකරණය කුමක්ද?.................
- ප්‍රස්තාරය y අක්ෂය වටා සමමිතික වේ. සමමිතික අක්ෂය $\chi$ හි අගය 0 වන සිරස් රේඛාව ඔස්සේ පිහිටා ඇත. එම නිසා සමමිති අක්ෂයේ සමීකරණය $\chi = 0$ වේ.
- $x$ හි අගය ඍණව වැඩිවන විට ප්‍රස්තාරය ඍණව අඩු වී (A සිට B දක්වා) $x = 0$ දී එනම් B හිදී අවම අගය ලබා ගනී.
- $x$ හි අගය ධනව වැඩි වන විට ශ්‍රිතය බිංදුවේ සිට (B සිට C තෙක්) ක්‍රමයෙන් වැඩි වේ.

පහත දැක්වෙන වගු වල හිස්තැන් පුරවමින් දී ඇති සමීකරණ දෙකට අදාලව එකම ඛණ්ඩාංක තලය මත ප්‍රස්තාර නිර්මාණය කරන්න.

a) $y = 2x^2$

| $x$ | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| $x^2$ | 9 | 4 | 1 | 0 | 1 | 4 | 9 |
| $2x^2$ | 18 | 8 | 2 | 0 | 2 | 8 | 18 |
| $y$ | 18 | 8 | 2 | 0 | 2 | 8 | 18 |
| ඛණ්ඩාංක | | | | | | | |

b) $y = \frac{1}{4}x^2$

| $x$ | -4 | -2 | 0 | 2 | 4 |
|---|---|---|---|---|---|
| $x^2$ | 16 | | 0 | 4 | |
| $\frac{1}{4}x^2$ | 4 | | 0 | 1 | |
| y | 4 | | 0 | 1 | |
| ඛණ්ඩාංක | | | (0,0) | | |